# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව / දෙමළ භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 2020

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර විභාග අධ්‍යයන මධ්‍යස්ථානය මඟින් 2020 වර්ෂයේ පැවැත්වීමට නියමිත දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව/ දෙමළ භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට කැමති අපේක්ෂකයින්ගෙන් 2019.12.30 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව**

**02. දෙමළ භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

**01. දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව**

මෙම පාඨමාලා අදියර තුනකින් සමන්විත ය.

**(i)** දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව

**(ii)** දෙමළ භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව

**(iii)** දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්**

**දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව**

- වයස අවුරුදු 16 සම්පූර්ණ කළ දෙමළ භාෂාව ඉගෙනීමට උනන්දුවක් දක්වන අය සඳහා

**දෙමළ භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව**

- අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත් වීම සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් සමත් වීම

  හෝ

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම

**දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව - SLQF Level 3- 30 Credits**

- අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙමළ භාෂාව ඇතුළු ව සමත් වීම සහ මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයෙන් ලකුණු 70% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගැනීම

  හෝ

- මෙම විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන දෙමළ භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව සමත් වීම

**දෙමළ භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

**SLQF Level 04 – 30 Credits**

සුදුසුකම්

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් දෙමළ භාෂා ඩිප්ලෝමාවක්
- දෙමළ භාෂාව විෂයය ඇතුළු ව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් වීම
- මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන දෙමළ ඩිප්ලෝමාව සම්පූර්ණ කළ අය හැර සෙසු අපේක්ෂකයන් උක්ත සඳහන් සුදුසුකම්වලට අමතර ව ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණයකට පෙනී සිට ලකුණු 70% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබා ගැනීම

**පාඨමාලා ගාස්තු**

| | | |
|---|---|---|
| දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව | - | රු. 20,000/- |
| දෙමළ භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව | - | රු. 25,000/- |
| දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | - | රු. 31,000/- |
| දෙමළ භාෂා උසස් ඩිප්ලෝමා පාඨමාලාව | - | රු. 36,000/- |

(විශ්වවිද්‍යාලය වෙත මේ සම්බන්ධ ව ගෙවූ කිසිදු මුදලක් ආපසු නොගෙවනු ලබන බව කරුණාවෙන් සලකන්න.)

**ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂණය :**

2020.01.19 දින ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (පශ්චාද් උපාධි සහ බාහිර විභාග මධ්‍යස්ථානය), 214, බෞද්ධාලෝක මාවත, කොළඹ-07 පරිශ්‍රයේ දී පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණයේ දී දක්වන කුසලතාව මත සිසුන් අදාළ පාඨමාලා සඳහා තෝරා ගනු ලැබේ.

## පාඨමාලා ආරම්භය හා පවත්වන ස්ථානය

දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව : සෙනසුරාදා දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා

දෙමළ භාෂා උසස් ඩිප්ලෝමාව : ඉරිදා දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා
පශ්චාද් උපාධි හා බාහිර විභාග මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 දී දේශන පැවැත්වේ.

**පාඨමාලා කාලය :** අවුරුදු 01

**අයදුම්පත් ලබාගත හැකි ආකාරය**

දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි **රු. 500/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ සරප් වෙත අදාළ ගාස්තු ගෙවා ලබා ගන්නා ලද ලදුපත 2019.12.24 දින දක්වා සතියේ වැඩ කරන දිනවල හා සෙනසුරාදා දිනයන්හි ප.ව. 3.00 ට පෙර අංක **214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 පිහිටි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි හා බාහිර විභාග මධ්‍යස්ථානයට** ඉදිරිපත් කිරීමෙන් අයදුම්පත් ලබා ගත හැකි ය.

තැපැල් මගින් අයදුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි **රු.500/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමඟ නම, ලිපිනය ලියන ලද 9"x4" ප්‍රමාණයේ රු. 15/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

**චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **පාඨමාලාවේ නම සඳහන් කර - " ........ අයදුම්පත්‍ර ලබා ගැනීම යනුවෙන්"** සඳහන් කළ යුතු ය.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී**
**පශ්චාද් උපාධි හා බාහිර විභාග,**
**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**
**නො. 214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07**

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක **711202** ට 'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය' නමින් රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සැ.යු. - බැංකුවට මුදල් ගෙවීමේ දී ලදුපතෙහි තැන්පත්කරුගේ නම සඳහන් ස්ථානයේ තම නම ඉදිරියෙන් "T/Dip" යන සංකේත අංකය සඳහන් කර ඒ යටතේ ගෙවීම කළ යුතු ය.**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.12.30 වන දින වේ. අයදුම්පත් තැපැල් මගින් එවන්නේ නම් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. **අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසු ව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වැඩි විස්තර: 011-2580609**

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
214, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
2019.11.29